සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# පළමුවාර අවසාන ඇගයීම
# First term End Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- .................................................................................... විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I කොටස

❖ **අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**(01) ක්‍රි. පූ. හයවන සියවසේ දී පමණ මෙරටට පැමිණ පදිංචි වූ ඉන්දියානු පිරිස් තම ජනාවාස සඳහා තෝරාගනු ලැබුවේ,**
- (1) තෙත් කලාපයයි.
- (2) වියළි කලාපයයි.
- (3) කඳුකර කලාපයයි.
- (4) වෙරළබඩ කලාපයයි.

**(02) ගම්වැව් සම්බන්ධ පහත ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.**
- (1) කුඩා දියපහරක් හෝ ඇලක් හරහා වේල්ලක් බැඳ ජලය රැස්කර ගැනීම
- (2) තුන් පැත්තකින් උස භූමියක ඉතිරි පැත්ත පස් බැම්මකින් ආවරණය කර වර්ෂා ජලය රඳවා ගැනීම
- (3) ඔයක් හෝ ගඟක් හරහා වේලිබැඳ ජලය රැස්කර ගැනීම
- (4) ගැමි නායකයන්ගේ මෙහෙයවීම මත ගමේ පිරිස එකතු වී වැව තැනීම

**(03) ක්‍රි. ව. 1215 දි රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට බලපෑ ප්‍රබලම සාධකය වූයේ,**
- (1) වැව් අමුණු විනාශවීමයි
- (2) රජවරු අතර ඇතිවූ බල අරගලයයි.
- (3) වසංගත රෝග පැතිරීමයි.
- (4) කාලිංග මාඝගේ ආක්‍රමණයයි.

**(04) දිවයිනේ ප්‍රථම වරට මහවැව් ඉදිකිරීමේ පුරෝගාමියා ලෙස සැලකෙන රජතුමා කවුරුන් ද?**
- (1) දේවානම්පියතිස්ස රජු ය.
- (2) වසභ රජු ය.
- (3) මහසෙන් රජු ය.
- (4) ධාතුසේන රජු ය.

**(05) වව්නියා මන්නාරම ප්‍රධාන මංසන්ධිය අසල මල්වතු ඔය හරහා ඉදිකර ඇති අමුණ හඳුන්වන්නේ කුමන නමින් ද?**
- (1) ඇලහැර අමුණ
- (2) මිනිපේ අමුණ
- (3) තේක්කම් අමුණ
- (4) හත්තොට අමුණ

**(06) බිම මැනීම පිළිබඳ අතීත ලාංකිකයන් සතුව පැවැති විශිෂ්ඨ දැනුම විදහාපාන හොඳම උදාහරණය වන්නේ,**
- (1) තල්වතු ඇල
- (2) මිනිපේ ඇල
- (3) ඇලහැර ඇල
- (4) යෝධ ඇල

(07) රන්මසු උයනට ජලය ලබාගෙන ඇත්තේ කුමන වැවෙන් ද?

(1) තිසා වැවෙන් ය. (2) කලා වැවෙන් ය.

(3) නුවර වැවෙන් ය. (4) මහකනදරා වැවෙන් ය.

(08) දිවයිනේ මුල්වරට උයනක් තනවන ලද රජතුමා ලෙස සැලකෙන්නේ,

(1) මුටසීව රජතුමා ය. (2) දේවානම්පියතිස්ස රජතුමා ය.

(3) කූටකණ්ණතිස්ස රජතුමා ය. (4) වසභ රජතුමා ය.

(09) පොකුණුවලට වැලි හා අපද්‍රව්‍ය එක්වීම පාලනය කළ තොරතුරු හමුවන පොකුණකට උදාහරණයක් වන්නේ මින් කුමක් ද?

(1) පොළොන්නරුවේ නෙළුම් පොකුණයි.

(2) අභයගිරියේ ඇත් පොකුණයි.

(3) රජගල පැරණි ආරාම සංකීර්ණයේ පොකුණු ය.

(4) රන්මසු උයනේ පොකුණු ය.

(10) මෙරට මුල්ම උද්‍යාන ලෙස සැලකිය හැකි උයන් දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නන්දන උයන, පද්මස්වර උයන (2) පද්මස්වර උයන, මහමෙවුනා උයන

(3) පද්මස්වර උයන, රන්මසු උයන (4) මහමෙවුනා උයන, නන්දන උයන

(11) සාහිත්‍ය මූලාශ්‍රය අනුව ලංකාවේ ඉදිවූ මුල් ම දාගැබ ලෙස සැලකෙන්නේ,

(1) අභයගිරි දාගැබ (2) ජේතවන දාගැබ

(3) ථූපාරාම දාගැබ (4) නීලගිරි දාගැබ

(12) මිහින්තලේ කණ්ඨක චෛතිය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරෙන් ඉතා නිවැරදි වගන්තිය තෝරන්න.

(1) ගඩොලින් තැනූ විශිෂ්ටතම නිර්මාණයයි.

(2) විශිෂ්ටතම වාහල්කඩ දක්නට ලැබේ.

(3) හොඳ ම මුරගල දක්නට ලැබේ.

(4) පැරණි රන් කම්හලක් පැවති බවට සාක්ෂි ලැබේ.

(13) නව පෝරණුවක් තනා අතීත ගඩොල්වල ප්‍රමිතියට ගඩොල් නිෂ්පාදනය සිදුකර, මෑත කාලයේ සංරක්ෂණය කල දාගැබ කුමක් ද?

(1) ථූපාරාමය (2) රුවන්මැලිසෑය

(3) අභයගිරි දාගැබ (4) ජේතවනාරාම දාගැබ

(14) රජරට සමයට අයත් කලාත්මක වටදාගෙය මින් කුමක් ද?

(1) මැදිරිගිරිය වටදාගෙය (2) පොළොන්නරුව වටදාගෙය

(3) ථූපාරාම වටදාගෙය (4) ලංකාරාමය වටදාගෙය

(15) වැසි ජලය ක්‍රමානුකූලව බැහැර කිරීමේ දියුණු ක්‍රමවේද මෙරට පැවති බවට තොරතුරු හමුවන්නේ,

(1) කුට්ටම්පොකුණ අසලිනි (2) අභයගිරි දාගැබ අසලිනි

(3) රුවන්මැලිසෑය අසලිනි (4) ආලාහන පිරිවෙන අසලිනි

(16) මහායාන අදහස් පැතිරයාමත් සමඟ ම මෙරට ජනප්‍රිය වූ වන්දනා ක්‍රමයක් වන්නේ,

(1) දේවතාවුන් වන්දනය (2) බෝධිසත්ව ප්‍රතිමා වන්දනය

(3) බෝධි වන්දනය (4) වෙහෙර වන්දනය

(17) අනුරාධපුර යුගයේ චිත්‍ර කලාවේ දියුණුව විදහාපාන සම්පූර්ණ චිත්‍ර දැකිය හැකි ස්ථානය මින් කුමක් ද?

(1) සිතුල්පව්ව (2) හිඳගල (3) වෙස්සගිරිය (4) සීගිරිය

(18) මෙරට කලා නිර්මාණ කෙරෙහි හින්දු ආගමික බලපෑම් තිබූ බවට හොඳම උදාහරණයක් වන්නේ,

(1) ගොඩනැගිලි ප්‍රවේශ දොරටු අභියස කොරවක්ගල හා මුරගල ඉදිකිරීම

(2) ගෙඩිගේ සම්ප්‍රදායට ගොඩනැගිලි ඉදිකිරීම

(3) ප්‍රතිමා වන්දනය ජනප්‍රිය වීම

(4) පොළොන්නරුවේ සඳකඩපහන්වලින් ගව රූපය ඉවත්වීම

**19 සහ 20 ප්‍රශ්නවල, දී ඇති "අ" සහ "ආ" තීරු නිවැරදිව ගළපා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(19)

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. ථූපාරාමය | A. නිශ්ශංකමල්ල රජතුමා |
| 2. මිරිසවැටිය | B. මහා පරාක්‍රමබාහු රජතුමා |
| 3. රන්කොත් වෙහෙර | C. දේවානම්පියතිස්ස රජතුමා |
| 4. දැදිගම කොටවෙහෙර | D. දුටුගැමුණු රජතුමා |

(1) ACBD (2) DCAB (3) CDAB (4) CDBA

(20)

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. නිල්ලක්කගම | A. ථූපාරාම පිළිමගෙය |
| 2. දඹේගොඩ | B. බෝධිසත්ව ප්‍රතිමාව |
| 3. අනුරාධපුරය | C. බෝධි සරය |
| 4. පොළොන්නරුව | D. කලාවැව |

(1) ABCD (2) CBDA (3) CADB (4) BCDA

(ලකුණු 2 x 20 = 40

## II කොටස

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

* අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(අ) 1. A වලින් දැක්වෙන නිර්මාණය හඳුනාගෙන නම් කරන්න.
2. මෙම නිර්මාණය හමුවී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?
3. මෙය කුමන කාර්යයක් ඉටුකර ගැනීම භාවිතා කර තිබේ ද?
4. මේ නිර්මාණය තුළින් හෙළිවන අපේ අතීත ලාංකිකයන් දැන සිටි තාක්ෂණය කුමක් ද?



A

(ආ) 1. පින්තූරයේ දක්නට ලැබෙන පොකුණ හඳුන්වන්නේ කුමන නමින් ද?
2. එම නම භාවිතා කිරීමට හේතුව කුමක් ද?
3. එය පිහිටා ඇති ඓතිහාසික නගරය නම් කරන්න.
4. එය නිර්මාණය කිරීමට භාවිතා කර ඇති එක් ද්‍රව්‍යයක් නම් කරන්න.



B

(ලකුණු 2 x 8 = 16)

(02) (i) මහාවංසයේ සඳහන් පරිදි පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ඉදිකළ වැව් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කුඩා ප්‍රමාණයේ වැව්වලට අමතරව මහවැව් තැනවීමට බලපෑ හේතුව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) විශාල වැව් තැනවීම නිසා ලාංකිකයන් ලබාගත් ජයග්‍රහණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) පහත සඳහන් වැව් ඉදිකළ රජවරු පිළිවෙළින් නම් කරන්න.

A. හුරුළු වැව          B. මාදතුගම වැව (ලකුණු 02)

(ii) ඇලවල් තැනවීමේ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වැවක ප්‍රධාන අංග තුනක් නම් කර, ඔබ කැමැති එක් අංගයකින් ඉටුවන කාර්යය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) පොකුණු තැනවීමේ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) රන්මසු උයනෙහි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) සීගිරි ජල උද්‍යානය පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)

(05) (i) ලෝහ කර්මාන්තයේ නියැලුනු පහත සඳහන් පුද්ගලයින් සෙල්ලිපිවල හඳුන්වා තිබූ නම් පිළිවෙළින් ලියා දක්වන්න.

A. ලෝහ වැඩ කරන්නා B. බෙලෙක් වැඩ කරන්නා (ලකුණු 02)

(ii) මෙරට දියුණු ලෝහ තාක්ෂණයක් පැවති බවට වගන්ති හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) අතීතයේ මෙරට පැවති කැටයම් හා මූර්ති කලාවේ දියුණුව පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) රජරට ශිෂ්ටාචාර සමයට අයත් ආගමික නොවන ගොඩනැගිලි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) චෛතියඝර හෙවත් වටදාගෙය යනුවෙන් හැඳින්වූයේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) පිළිම ගෙවල් නිර්මාණය කළ සම්ප්‍රදායන් තුන නම් කර, ඒ පිළිබඳ වගන්ති දෙකක් ලියන්න. (ලකුණු 05)

(07) (i) රුවන්වැලි මහ සෑ මළුවෙන් හමු වූ රාජකීය ප්‍රතිමා දෙකෙන් නිරූපිත රජවරු දෙදෙනාගේ නම් ලියන්න. (ලකුණු 02)

(ii) කලාත්මක නිර්මාණයක් වන සඳකඩ පහන පිළිබඳ වගන්ති දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මෙරට පැරණි වෛද්‍ය විද්‍යාව හා සනීපාරක්ෂක කටයුතුවල පැවති දියුණුව පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)